**ශීර්ෂය 278 - රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

-------------------------------------------------------

## 1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

(අ) රජයේ කාර්යයන් සම්බන්ධීකරණය.

(ආ) ගම් මට්ටමින් හා ප්‍රාදේශීය මට්ටමින් නිලධාරීන් හා සංවිධාන මාර්ගයෙන් නීතියෙන් පවරා දී ඇති කාර්යයන් සාධනය කිරීම.

(ඇ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීම.

(ඈ) විවිධ ශීර්ෂයන්ට අදාල ආදායම් එකතු කිරීම.

(ඉ) විමධ්‍යගත අයවැය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ඊ) පළාත් සභාවලට ඒවායේ කටයුතුවල දී සහාය වීම.

## 1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල

| | | | | | |
|---|---|---|---|---|---|
| (අ) | අයගම | (උ) | කලවාන | (ක) | නිවිතිගල |
| (ආ) | ඇලපාත | (ඌ) | කහවත්ත | (ග) | පැල්මඩුල්ල |
| (ඇ) | ඇහැලියගොඩ | (එ) | කිරිඇල්ල | (ජ) | බලංගොඩ |
| (ඈ) | ඇඹිලිපිටිය | (ඒ) | කුරුවිට | (ට) | රත්නපුර |
| (ඉ) | ඉඹුල්පේ | (ඔ) | කොලොන්න | (ඩ) | වැලිගෙපොල |
| (ඊ) | ඕපනායක | (ඕ) | ගොඩකවෙල | | |

## 1.3 විගණන විෂය පථය

රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ජූලි 25 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථා, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධාන සහ රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.5 විගණන නිරීක්ෂණය**

---

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා හා පොත් අනුව, රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඈ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) විසර්ජන ගිණුම්

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුළු ප්‍රතිපාදනය හා වියදම

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.726,425,000 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.718,272,890 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.8,152,110 ක් හෙවත් සියයට 1.12 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 635,275,000 | 631,384,194 | 3,890,806 | 0.61 |
| මූලධන | 91,150,000 | 86,888,696 | 4,261,304 | 4.68 |
| **එකතුව** | **726,425,000** | **718,272,890** | **8,152,110** | **1.12** |

(ii) අයවැය විචලනය

වැය විෂයයන් 02ක් සඳහා අධි ප්‍රතිපාදන සැලැසීම නිසා ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17ක් හා සියයට 37 ක් වී තිබුණි.

(iii) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 26ක් හා දෙපාර්තමේන්තු 18ක් විසින් එකතුව රු. 3,817,778,060 ක් වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණු අතර, එම ප්‍රතිපාදන පිළිවෙලින් රු.1,777,765,254 ක් හා රු.1,797,917,136 ක් වශයෙන් එකතුව රු.3,575,682,390 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට පිළිවෙලින් රු.196,055,585ක් හා රු. 46,040,085ක් වශයෙන් එකතුව රු.242,095,670 ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරිවීම් ලබා දී තිබුණු ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 10 ක් හා සියයට 2ක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමා හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 27801 | 52,000,000 | 46,264,156 | 32,000,000 | 36,831,694 | 207,000,000 | 152,922,343 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 27801 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය පරිදි එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 2,559,337ක් විය.

(ii) එකතුව රු. 87,530ක් වූ ණය ශේෂ 03ක් සීසී 10 ලේඛනයේ ඇතුළත්ව තිබුණ ද, රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමෙහි ඇතුළත්ව නොතිබුණි. එමෙන්ම එම ගිණුමෙහි ඇතුළත්ව තිබුණු රු. 2,900ක ශේෂයක් සීසී 10 ලේඛනයේ ඇතුළත්ව නොතිබුණි.

(iii) කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ 2013 දෙසැම්බර් 31 දිනට එකතුව හා එදිනට දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය අතර රු.32,421 ක නොසැසඳුනු වෙනසක් පැවැතියද, එය එදිනට පිළියෙල කළ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශයෙ දක්වා නොතිබුණි.

(ඈ) අග්‍රිම ගිණුම්
-------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට පැවති අග්‍රීම ශේෂය වූ රු. 136,250 ක මුදල 2014 ජූලි 16 දින පියවා තිබුණි.

(ඈ) පොදු තැන්පත් ගිණුම්
-----------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.281,726,892ක් විය.

**1.6 වත්කම් කළමනාකරණය**
---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
---------------------------------------

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක ගොඩනැගිලි 02ක් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ එක් වාහනයක් අභාවිතව පැවතිණි.

(ii) ඕපනායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගබඩාවේ වර්ෂ ගණනාවක සිට පැවැති ආරක්ෂක කබා 05ක් ඉන්වෙන්ට්‍රිගත කර නොතිබුණු අතර, හියුම් පයිප්ප 03ක් කිසිදු ප්‍රයෝජනයකින් තොරව වර්ෂ ගණනාවක සිට කාර්යාල භූමියේ රඳවා තිබුණි.

(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්
------------------------------------------

වටිනාකම තක්සේරු කර නොතිබුණු ඉඩමක් කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විදුලි සංදේශ ආයතනයක් වෙත මුදාහැර තිබුණි.

(ඇ) වෙනත් ආයතන සතු වත්කම් පරිහරණය කිරීම
--------------------------------------------------

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් වටිනාකම තක්සේරු කර නොතිබුණු හෙක්ටයාර් 0.34ක ඉඩමක් 1998 වර්ෂයේ සිට ඇලපාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් භාවිතයට ගෙන තිබුණි.

**1.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**
-----------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේදි ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපාතිවල පහත සඳහන් දුරවලතාවන් අනාවරණය විය.

(අ) නිසි පරිදි ඉටු නොකළ ව්‍යාපෘති
-------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති නිසි පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි.

(i) කුරුවිට, ඕපනායක, ඇහැලියගොඩ හා පැල්මඩුල්ල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ක්‍රියාත්මක කළ කර්මාන්ත 07කට අදාල පිරිවැය රු.622,293 ක්වූ වැය විෂයයන් 08 ක ඇස්තමේන්තුගත වැඩ කොටස් නිසි පරිදි ඉටු කර නොතිබුණි.

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලද ප්‍රතිපාදන මගින් පනහඩුව වැව ප්‍රතිසංස්කරණය සඳහා ගොවිජන සේවා සහකාර කොමසාරිස් විසින් ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම සමග 2011නොවැම්බර් 14 දින ගිවිසුමකට එළැඹ තිබුණි.

මෙම කර්මාන්තයට අදාලව නොකළ වැඩ වෙනුවෙන් රු.375,670ක්ද, අනුමත රේටයන්ට වැඩියෙන් ගෙවීම් කිරීම හේතුවෙන් රු.42,258ක් ද වශයෙන් එකතුව රු.417,928 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(iii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලද ප්‍රතිපාදන මගින් කෝන්කටුවආර වැව ප්‍රතිසංස්කරණය සඳහා ගොවිජන සේවා සහකාර කොමසාරිස් විසින් ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම සමඟ 2012 පෙබරවාරි 05 දින ගිවිසුමට එළැඹ තිබුණි.

එම වැව ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ..

- 2013 නොවැම්බර් 30 දිනට අවසන් කළ යුතු මෙම ප්‍රතිසංස්කරණ කටයුතු 2014 ජනවාරි 21 දින වන විට අත් හැර දමා තිබුණි. මේ නිසා වර්ෂ 1½ක පමණ කාලයක සිට කෝන්කටුවආර වැවෙහි ජලය හිස් කර තිබීමෙන් වර්ග සැතපුම් 2.6ක පෝෂක ප්‍රදේශයේ වූ කුඹුරු අක්කර 95ක් පමණ වගා කිරීම සඳහා අවශ්‍ය ජල සැපයුම ලබා දීම අඩාලව පැවැතිණි.
- කොන්ත්‍රාත්කරු වෙත 2012 අගෝස්තු 15 දින අත්තිකාරම් ලෙස ගෙවූ රු.1,904,000 කින් 2014 ජනවාරි වන විට රු.1,025,274 ක් තවදුරටත් අයවීමට තිබුණි.

**(ආ) නිෂ්ඵල වියදම්**

ව්‍යාපෘති සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂණවලදී නිෂ්ඵල වියදම් වශයෙන් අනාවරණය වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

(i) ගොඩකවෙල සංස්කෘතික මධ්‍යස්ථානයේ අලුත්වැඩියාව සඳහා 2009 වර්ෂයේ දී සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයෙන් ලද රු. 1,954,332ක් වැය කළ ද, 2013 ඔක්තෝබර් වන විට ගොඩනැගිල්ල අවට වල් බිහිවී භාවිතයකින් තොරව පැවැතිණි. විදුලි ජේනු හා අනෙකුත් සවි කිරීම් ගලවා ගෙන ගොස් තිබුණි. ගොඩනැගිල්ලෙහි එක් යතුරක් බාහිර පාර්ශවයක් සතුව පැවැති අතර දැනට එය සමාජ විරෝධී ක්‍රියා සිදුවන ස්ථානයක් බවට පත්ව තිබුණි.

(ii) කහවත්ත සංස්කෘතික මධ්‍යස්ථානය ඉදි කිරීම් ආරම්භ කිරීමට පෙර භූ ස්ථාවරත්වය සම්බන්ධයෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් නිර්දේශ ලබා නොගැනීමත්, ඉදි කිරීම් ආරම්භ කිරීමෙන් පසු එම භූමියේ පැවැති නාය යෑමේ අවදානම මත එම ආයතනයෙන් ලබා ගත් නිර්දේශවලට අනුව කටයුතු නොකිරීම නිසා 2013 දෙසැම්බර් මස වන විට ඉදි කිරීම් නිම කළ ගොඩනැගිලි පවා කිසිදු කටයුත්තක් සඳහා යොදා ගත නොහැකි ව පැවැතිණි. මේ නිසා අදාල අරමුණ ඉටු වී නොතිබුණු අතර වැය කළ රු.1,014,854 ක් නිෂ්ඵල වී තිබුණි.

(iii) කුරුවිට ප්‍රාදේශීය ලේකම් නිල නිවස සඳහා පිවිසෙන මාර්ගය තැලීමට කුරුවිට ප්‍රාදේශීය සභාවේ මාර්ග තලනය ප්‍රවාහන වියදමකින් තොරව යොදා ගත හැකිව තිබිය දී ඒ සඳහා රු.10,000 ක් වැය කර තිබුණි.

(iv) ඕපනායක සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම් ආරම්භ කර වර්ෂ 03ක් ඉකුත් වී තිබුණ ද, ඉදිකිරීම් අතරමග නතර කිරීම නිසා අවට වල් බිහි වී ගොඩනැගිල්ල කිසිදු

ප්‍රයෝජනයකට ගත නොහැකි තත්ත්වයක පැවතුණි. මේ නිසා ඒ වෙනුවෙන් වැය කළ රු. 2,859,309 ක් නිෂ්ඵල වී තිබුණි.

**(ඇ) මෙහෙයුම් දුර්වලතා**

පළාත් මාර්ග කාපට් කිරීමේ වැඩසටහන යටතේ රත්නපුර දිස්ත්‍රික්කය තුළ මාර්ග කාපට් කිරීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලද රු.440,000,000 ක ප්‍රතිපාදන මගින් 2013 දෙසැම්බර් 31 දිනට රු. 267,334,490 ක් වැය කර ව්‍යාපෘති 52ක් ක්‍රියාත්මක කර තිබුණි. මේ සම්බන්ධයෙන් කළ නියැදි පරීක්ෂාවේ දී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ගිවිසුම පරිදි 2012 වර්ෂයේ ආරම්භ කර මාස 06ක් තුළ වැඩ නිම කළ යුතු ඇස්තමේන්තුගත වටිනාකම රු.5,890,465,581ක් වූ ව්‍යාපෘති 52කම 2014 මාර්තු 31 දින වන විටත් වැඩ නිම කර නොතිබුණි.

(ii) ප්‍රගති වාර්තාව අනුව සම්පූර්ණයෙන්ම වැඩ නිම කළ බවට දක්වා තිබුණු ව්‍යාපෘති 03ක දුර ප්‍රමාණය, ගිවිසුම පරිදි එකඟ වූ දුර ප්‍රමාණයට වඩා කිලෝ මීටර් 0.19 ක් අඩු වී තිබුණි. ඉටු නොකළ එම වැඩවල වටිනාකම රු.3,117,903 ක් විය.

(iii) මෙම සියලු ව්‍යාපෘතිවල ඉදි කිරීම් සඳහා ඉඩ දුන් කාලය 2014 මාර්තු 31 දින වන විට අවසාන වී තිබුණද, නැවත කාලය දීර්ඝ කර ගෙන නොතිබුණි. එමෙන්ම, අනුමත ව්‍යාපෘති ලේඛනයට සිදු කරන ලද සංශෝධන සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන කිලෝ මීටර් 19.14 ක දුර ප්‍රමාණයක් අඩු කර තිබුණි.

(iv) 2014 පෙබරවාරි 28 දින පිළියෙල කළ ප්‍රගති වාර්තාවට අනුව ව්‍යාපෘති 06ක වැඩ සම්පූර්ණයෙන් නිම කිරීම සඳහා රු.293,144,779 ක් වැය කර තිබුණත්, ඒවායේ ඇස්තමේන්තුගත වටිනාකම රු.467,387,712 ක් වී තිබුණි. මේ නිසා ප්‍රතිපාදන ඉතිරිය රු.174,242,923 ක් වී තිබුණු බැවින් අධි ඇස්තමේන්තු සකස් කිරීමේ ප්‍රතිශතය නිම කළ වැඩ වටිනාකමට සාපේක්ෂව සියයට 59 ක් වී තිබුණි.

(v) වර්ෂ 02කට වඩා කල් ඉකුත් වී තිබුණු නමුත් වැඩ අවසන් නොකළ ව්‍යාපෘති 05ක ඉදි කිරීම් නිම කළ ප්‍රතිශතය 2014 පෙබරවාරි 28 දින පිළියෙල කළ ප්‍රගති වාර්තාවට අනුව සියයට 40 ක් වී තිබුණි. කෙසේ නමුත්, ඇස්තමේන්තුගත මුදල හා වැය කළ මුදල පිළිවෙලින් රු.623,279,440 ක් හා රු.43,360,011ක් වීම නිසා ඒවායේ මූල්‍ය ප්‍රගතිය සියයට 7ක අඩු අගයක් ගෙන තිබුණි.

## 1.8 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

ග්‍රාම නිලධාරී කාර්යාල වෙනුවෙන් වානේ මේස 60 ක් හා වානේ කබඩ් 23 ක් මිල දී ගැනීම සඳහා සැපයුම්කරු විසින් තාක්ෂණික ඇගයීම් කමිටුවට ඉදිරිපත් කළ සාම්පලය සපයන ලද භාණ්ඩ සමඟ සැසඳීමේ දී නිම කරන ලද තහඩුවල ඝණකම සියයට 13කින් අඩු වී තිබුණි. එය මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ද තහවුරු කර තිබුණි. මේ නිසා ප්‍රමිතියෙන් අඩු භාණ්ඩ මිල දී ගැනීම වෙනුවෙන් රු.1,140,675 ක් වැය කර තිබුණි.

## 1.9 කළමනාකරණ දුර්වලතා

ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරික්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රත්නපුර දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් එක් ගෘහයකට කිකිළි පැටවුන් 10 දෙනා බැගින් බෙදා දීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන මගින් 2011 හා 2012 වර්ෂ තුළ රු.8,806,900 ක් රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය.

(i) 2011 ඔක්තෝබර් සිට 2012 නොවැම්බර් දක්වා සබරගමුව පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් රු.400 බැගින් කිකිළි පැටව් 17,971ක් ලංසු කැඳවීමකින් තොරව ලබාගෙන තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුව විසින් 2012 නොවැම්බර් 21 දින ගත් තීරණය පරිදි එක් පැටවකු රු.345 කට ලබා ගැනීමට හැකියාව තිබුණි. මේ අනුව රේඛීය අමාත්‍යාංශ තීරණයක් නිසා වැඩිපුර ගෙවීමට සිදු වූ මුදල රු.988,405 ක් වී තිබුණි.

(ii) මේ සඳහා කිසිදු ලංසු කැඳවීමක් හා ගිවිසුම්වලට එළැඹීමක් සිදු කර නොතිබුණි.

(iii) මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳ පසු විපරමක් කළ බවට තහවුරු කරගත නොහැකි විය.

(ආ) 2013 වර්ෂය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණයේ පවිත්‍රතා කටයුතු සිදු කිරීම සඳහා රු. 118,900 ක මාසික ගාස්තුවක් ඉදිරිපත් කළ ආයතනය වෙත ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ටෙන්ඩර් ඇගයීම් කිරීමේ දී අවම මිලක් ඉදිරිපත් කළ ආයතනය විසින් කසල ඉවත්කරන ස්ථානය හා ඉවත් කරන කාල වකවානු පැහැදිලිව දක්වා තිබිය දී, එහි කසල බැහැර කිරීමේ ක්‍රමවේදයක් නොමැති බවත්, ප්‍රසම්පාදනය පිරිනමන ලද ආයතනය විසින් එවන්

ක්‍රමවේදයක් දක්වා නොතිබිය දී, එහි කසල බැහැර කිරීම පිළිබඳ ක්‍රමවේදයක් ඇති බවත් තාක්ෂණික ඇගයීම් කමිටුවේ තීරණය විය.

(ii) සේවා ගිවිසුමේ 05 වැනි ඡේදය පරිදි පිරිමි තිදෙනෙකු සේවයේ යෙදවිය යුතු වුවත්, සේවා කොන්ත්‍රාත්තුව අවසන් වීම දක්වාම පිරිමි සේවකයන් දෙදෙනෙකු පමණක් සේවයේ යොදවා තිබුණි.

## 1.10 පාඩු හා හානි

---------------

නියැදි විගණන පරීක්ෂණවල දී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 2010 අප්‍රේල් මස එවකට සිටි ප්‍රාදේශීය ලේකම්වරියගේ පෞද්ගලික නිවසේ නවතා තිබිය දී ගිනිගෙන තිබුණි. මේ පිළිබඳව මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු නොකළ බව විගණනය විසින් දන්වා සිටීම නිසා අනතුර සිදු වී මාස 38කට පසුව 2013 ජූනි මස ප්‍රාරම්භක වාර්තාව ලබා දී තිබුණි.

(ආ) කුරුවිට ප්‍රාදේශීය ලේකම් නිල නිවසට පිවිසෙන මාර්ගය හා කුරුවිට පහළගම බෞද්ධ විද්‍යාලයේ ගෙබිම කොන්ක්‍රීට් කිරීමේ දී රු. 24,875ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 1.11 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

---------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 59 | 47 | 12 | - |
| (ii) | තෘතීයික මට්ටම | 162 | 186 | 14 | 38 |
| (iii) | ද්විතීයික මට්ටම | 1,029 | 830 | 204 | 05 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 173 | 172 | 10 | 09 |
| (v) | වෙනත්(අනියම්/තාවකාලික /කොන්ත්‍රාත් පදනම) | - | 01 | - | 01 |
| | එකතුව | 1423 | 1236 | 240 | 53 |

1992 වර්ෂයෙන් පසු අනුමත කාර්ය මණ්ඩලය ප්‍රතිශෝධනයට ලක් ව නොතිබුණි.